**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව**

විෂය - චිත්‍ර කලාව

සතිය - 12

ශ්‍රේණිය - 6

සැකසුම - තමාලි පරණගම

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :-** 5.0 විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම :-** 5.1 ඇඹීමේ හා එකලස් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයෙන් මූර්ති නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම :-** මානව රූප හා සත්ව රූප උන්නතව නිර්මාණයක් කරමු.

ආදරණීය දුවේ පුතේ,

මූර්ති නිර්මාණය කිරීමේදී විවිධාකාර වූ ශිල්පීය ක්‍රම භාවිත කරයි.

1. ඇඹීම - අවශ්‍ය කොටස් එකතු කරමින් ගොඩනැංවීමේ ශිල්ප ක්‍රමයකි.
2. තෙලීම - අනවශ්‍ය කොටස් ඉවත්කර අවශ්‍ය කොටස් ඉතිරි කිරීමයි.
3. වාත්තු කිරීම - අච්චුවක් මතට ලෝහ උණුකර වත් කිරීමෙන් කැටයම් නිර්මාණය කිරීමයි.
4. එකලස් කිරීම - ඉවතලන කොටස් එකතුකර මූර්ති නිර්මාණය කිරීම.

**<u>පදම් කළ මැටි භාවිතා කර උන්නතව මානව රූප හා සත්ව රූප නිර්මාණය කරමු.</u>**

**අවශ්‍ය ද්‍රව්‍ය:-** පදම් කල මැටි, ලෑලි කැබැල්ලක්, ඩිමයි කොලයක්, ඇඹීමේ උපකරණ, පැන්සලක්, වර්ණ

**ක්‍රියාකාරකමෙහි නිරත වීමට පියවරයන් :-**

01. ලෑලි කෑල්ල මත පදම් කළ මැටි වලින් කොටසක් ගෙන අතුරා ගන්න. මෙහිදී සමානව මැටි ගා ගත යුතුය.

02. ලෑලි කෑල්ලේ ප්‍රමාණයට ඩිමයි කොලය කපා ගන්න.

03. ඩිමයි කොලයේ ඔබ ඇඹීමට බලාපොරොත්තුවන රූපය ඇඳගන්න.

04. ඇඳගත් රූපය කලින් ඔබ විසින් සාදා ගත් මැටි පුවරුව මත තබා පැන්සලෙන් නැවත අඳින්න.

05. ඇඳ ගැනීමෙන් පසු ඔබ ඩිමයි කොලය මැටි පුවරුවෙන් ඉවත් කරන්න.

06. දැන් ඔබට ඔබ ඩිමයි කොළය මත අඳින ලද රූපය මැටි පුවරුව මත අච්චුවක් ලෙස සටහන් වී ඇති ආකාරය දැක ගත හැකිය.

07. දැන් ඔබට සත්ව රූපයේ අවශ්‍ය කොටස් සඳහා මැටි කොටස් යොදා ගනිමින් රූපය පුරවා ගත හැකිය.

08. ඉන්පසු ටූල් භාවිතා කර සත්ව රූපයේ හෝ මානව රූපයේ ඇස්, හිසකෙස්, ලොම් ආදිය මතු කරන්න.

09. වියළුණු පසුව බැනර් පේන්ට් හෝ ලැකර් භාවිතා කර වර්ණ ගන්වන්න.

පහත ඡායාරූප බලන්න.







මිනිස් රූප හා සත්ව රූප උන්නතව නිර්මානය කර ඇති සැටි බලන්න.







